**පුරවැසි අධ්‍යාපනය - 9 ශ්‍රේණිය**

## 02 - කාලීන වෙනස්වීම්.

•සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පෙළපොත හොඳින් කියවා අවබෝධ කරගෙන පිළිතුරු සපයන්න.

1. යෝග්‍යතා තාක්ෂණය යනු කුමක්දැයි සරලව දක්වන්න.
2. තිරසර සංවර්ධනය යනු කුමක්ද?
3. තිරසර සංවර්ධනය සඳහා යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ මොනවාද?
4. ඕනෑම රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුනක් කෙටියෙන් හඳුන්වන්න.
5. වර්තමානය වන විට කෘෂිකාර්මික අංශය තුළ සිදුවන කාලීන වෙනස්වීම් කිහිපයක් ගෙන හැර දක්වන්න.
6. වර්තමානයේ දී කාර්මික අංශය තුළ සිදුවී ඇති කාලීන වෙනස්කම් හතරක් ලියන්න.
7. අතීතයේ දරුවන් අධ්‍යාපනය ලැබූ ස්ථානය හැඳින් වූයේ කුමන නමකින්ද? එහි අකුරු ලිවීමට බහුලව භාවිතා කළේ කුමක්ද?
8. එයට අමතරව අකුරු ලිවීමට භාවිතා කළ උපකරණ දෙකක් ලියන්න.
9. වර්තමානයේ පාසල් අධ්‍යාපනය තුළ භාවිතා කරනු ලබන තාක්ෂණික උපාංග නම් කරන්න.
10. අන්තර්ජාලය භාවිතා කරමින් වෙනත් රටවල් වල පවතින පාඨමාලා පවා හැදෑරීමට හඳුන්වාදී ඇති සේවාව කුමක්ද?
11. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වඩාත් නිවැරදිව රෝග හඳුනාගැනීමට භාවිතා කරනු ලබන උපකරණය කුමක්ද?
12. බැංකු කටයුතු පහසු කර ගැනීම සඳහා දී ඇති තාක්ෂණික උපකරණ තුනක් ලියන්න.
13. අන්තර්ජාලය හරහා දේශීය හා විදේශීය බැංකු කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීමට හඳුන්වාදී ඇති සේවාව කුමක්ද?
14. ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය තුන මොනවාද?
15. අතීත ගොඩබිම් හා ජල ප්‍රවාහන මාධ්‍යයන් තුන බැගින් ලියන්න.
16. අතීත සන්නිවේදන මාධ්‍යන් හතරක් ලියන්න.
17. වර්තමාන සන්නිවේදන මාධ්‍යයන් හතරක් ලියන්න.
18. ආර්ථිකයේ සිදුවන විවිධ වෙනස් වීම් පුද්ගලයා හා සමාජය කෙරෙහි ඇති කරන බලපෑම් 5ක් ලියන්න.
19. එම වෙනස්වීම් උචිත පරිදි භාවිතයට ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.
20. වැඩ ලෝකයේ යනු කුමක්ද?
21. රැකියා වෙළෙඳපොළ යනු කුමක්ද?
22. වර්තමාන රැකියා වෙළෙඳපොළ පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ ඇතිවන රැකියා අවස්ථා තුන බැගින් ලියන්න.
    - කෘෂිකාර්මික
    - කාර්මික
    - සේවා
23. විවිධ රැකියා සඳහා පවතින ඉල්ලුම වෙනස්වීමට බලපාන සාධක මොනවාද?
24. රැකියා වෙළඳපොළෙහි නව ප්‍රවණතා ඔස්සේ විවෘතව ඇති නව රැකියා හතරක් ලියන්න.
25. යහජීවනය යනු කුමක්ද?
26. යහජීවනය පිළිබඳ කියැවෙන "සිරිමත්" කවි පන්තිය කාගේ නිර්මාණයක් ද? එය ඇතුලත් කෘතිය කුමක්ද?
27. යහජීවනය පිළිබඳ කියැවෙන දමිළ කාව්‍ය කෘතියක් නම් කරන්න.
28. සමාජ යහපත උදෙසා යහජීවනය ඇති අවශ්‍යතාව කුමක්ද?
29. යහජීවන ගුණාංග යනු කුමක්දැයි හඳුන්වා එයට උදාහරණ 5ක් ලියන්න.
30. සහජීවනයෙන් කටයුතු නොකිරීම නිසා ඇතිවිය හැකි ප්‍රතිවිපාක මොනවාද?
31. සහජීවනයෙන් කටයුතු කිරීම නිසා සමාජයට අත්වන ප්‍රතිලාභ මොනවාද?

32. "කණ්ඩායම් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකට ජීවත්වීමේදී එකිනෙකාගේ වෙනස් කම් වලට ගරු කරමින් ප්‍රචණ්ඩත්වයෙන් තොර ව ප්‍රශ්න විසඳාගෙන ජීවත්වීම සහජීවනයයි" යනුවෙන් සහජීවනය නිර්වචනය කරන ලද්දේ කව්ද?
33. වර්තමාන සමාජයට සහජීවනය අවශ්‍ය වන්නේ ඇයි?
34. සහජීවන ගුණාංග 5ක් ලියන්න.
35. එම ගුණාංග ජීවිතයට අදාළ කර ගැනීමෙන් ඇතිවන ප්‍රතිලාභ මොනවාද?
36. යහජීවනය හා සහජීවනය දෙකම නොමැති පුද්ගලයින් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්න.
37. සමුපකාරය යනු කුමක්ද?
38. සමුපකාර ව්‍යාපාරයේ පියා කවුද? ඔහු එම ව්‍යාපාරය පිළිබඳව ඉදිරිපත් කළ නිර්වචනය ලියන්න.
39. නූතන සමුපකාර ව්‍යාපාරය පිළිබඳ නිල නිර්වචනය ලියන්න.
40. සමුපකාර ව්‍යාපාරයේ අරමුණු මොනවාද?
41. සමුපකාර ආදර්ශපාඨය කුමක්ද?
42. ශ්‍රී ලංකාවේ පිහිටවූ පළමු සමුපකාර සමිතිය කුමක්ද?
43. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමුපකාර සමිති වර්ග නම් කරන්න.
44. සමුපකාර සේවාවන් ඉටුවන කාර්යයන් මොනවාද?
45. විවිධ සේවා සමුපකාර සමිතිය මගින් ඉටුවන සේවාවන් ලියන්න.
46. පාසල් සමුපකාර සමිතිවල පරමාර්ථ මොනවාද?
47. පාසල් සමුපකාර සමිතියෙන් පාසල් දරුවන්ට ලබා ගත හැකි සේවා 5ක් ලියන්න.
48. දේශීය සංස්කෘතිය යනු කුමක්ද?
49. දේශීය නිෂ්පාදන යනු මොනවාද?
50. දේශීය ඖෂධ 5ක් ලියන්න.
51. දේශීය ශාක 5ක් ලියන්න.
52. දේශීය සතුන් 5ක් ලියන්න.
53. ජපානයේ තවමත් දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතික අංග තුනක් ලියන්න.
54. තමාගේ ඇඳුම තමා විසින් සකසා ගත් ලෝක ප්‍රකට ශ්‍රේෂ්ඨ නායකයා කවුද?
55. අන්‍යෝන්‍ය රැඳියාවෙන් කටයුතු කිරීම සඳහා පිහිටුවාගෙන ඇති ජාත්‍යන්තර සංවිධාන හතරක් ලියන්න.

*දෙවන පාඩම හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නය ලියා පිළිතුරුද ලියන්න.